**සොරණාතොට ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සොරණාතොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (කාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම ප්‍රමූල්‍ය)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් (LDSP) මුදල් ලබා ගැනීමේදී ප්‍රාග්ධන ආධාර ගිණුම බැර කර තිබුණු අතර, අරමුදල් වලින් ඉතිරි වී තිබුණු මුදල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ බැංකු ගිණුමට බැර කිරීමේදී විවිධ තැන්පතු ගිණුම රු.5,396,605 ක් හර කර තිබුණි. | මුදල් ලැබීමේදී ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර ඇති බවත් ඉතිරි මුදල් තැන්පතු අඩු වීමක් ලෙස හර කර ඇති බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින කර්මාන්ත අතරුදවුම් සඳහා ලැබී තිබුණු රු.545,259 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ණයගැති හා කර්මාන්ත ණය හිමි ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂ දෙකකට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු වැටුප් ප්‍රතිපූර්ණය රු.329,624 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබූ වැඩ බැලීමේ දීමනා රු.60,300 ක් ණය ගැති ශේෂය තුළ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබූ වැඩ බැලීමේ දීමනා රු.60,300 ක් ණය ගැති ශේෂය තුළ දැක්වීමෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා ඇති බව. | -එම- |
| (ඉ) | ගබඩාවේ පැවති රු.735,954 ක විදුලි, ජල සහ පාරිභෝගික භාණ්ඩවල අවසන් තොග වටිනාකම පොදු ගබඩා තොගය තුළ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.4,454,888 ක් වුවද, එය රු.4,187,822 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුද්දර ගාස්තු ආදායම රු.2,011,992 ක් වුවද, එය රු.1,022,431 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී මිළදීගෙන තිබුණු රු.52,000 ක් වූ කසළ බැහැර කරන කරත්තය රු.520,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් දෙකකට අදාළව මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශන අනුව ශේෂ එකතුව හා උපලේඛන අනුව ශේෂ එකතුව අතර රු.1,622,378 ක් වෙනසක් විය. | ඉදිරි වර්ෂයේදී අවසන් ගිණුම් තුළින් නිවැරදි කරන බව. | එක සමාන ගිණුම් ශේෂ සැසඳීමක් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.6,105,101 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ලීබඩු සවිකිරීම් ශේෂය සනාථ කිරීම සඳහා සවිස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වටිනාකම් පොත්වලට ගැනීමේදී මගහැරීම් සිදු වී ඇති අතර, කළමනාකරණ කමිටුවේ අනුමැතියට යටත්ව ඉදිරියේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන රීති) සංග්‍රහය | | | |
| | 204 රීතිය | භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබුණු වටිනාකමක් සඳහන් නොවන විෂයයන් 57 කට අයත් භාණ්ඩ ඒකක 152 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ වලින් බොහෝ ප්‍රමාණයක් සොයාගෙන ඇත. තවදුරටත් ඌන භාණ්ඩ සඳහා නිර්දේශ ක්‍රියාත්මක කරන බව. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් හඳුනාගත් ඌනතාවයන් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.5,637,185 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,935,636 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්ත මේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 102,724 | 97,906 | 56,314 | 41,591 | 101,724 | 98,498 | 68,639 | 29,842 |
| (ii) | කුලී | 754,200 | 725,520 | 507,988 | 217,533 | 592,100 | 734,036 | 267,516 | 466,520 |
| (iii) | වෙනත් ආදායම් | 3,851,000 | 2,273,740 | 1,725,835 | 547,905 | 2,999,260 | 2,580,133 | 1,602,385 | 977,748 |
| | එකතුව | 4,707,924 | 3,097,166 | 2,290,137 | 807,029 | 3,693,084 | 3,412,667 | 1,938,540 | 1,474,110 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු සහ කඩ කුලී** | | |
| | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් හා බදු රු. 121,037 ක් සහ හිඟහිටි කඩ කුලී රු. 204,706 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ වරිපනම් සහ කඩ කුලී ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | **උසාවි දඩ සහ මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 222,615 ක් සහ මුද්දර ගාස්තු රු.793,026 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | මේ වනවිට උසාවි දඩ වලින් රු.29,100 ක් හා මුද්දර ගාස්තු වලින් රු.229,405 ක් අය කර ඇත. ඉතිරි මුදල් සඳහා ඉල්ලීම් කර ඇති බව. | හිඟ හිටි උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) වගන්තිය අනුව නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථානයේ කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමට කටයුතු කරමින් පවතී. ඉන් පසු පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගන්නා බව. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන විධිමත්ව කසළ බැහැර කිරීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැයෙන් අරමුණුගත වූ ප්‍රදේශයේ මාර්ග, පොදු ළිං, සතිපොළ, බහුකාර්ය ගොඩනැඟිලි වැනි විවිධ ව්‍යාපෘති යෝජනා 176 කින් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. | අපේක්ෂා කළ පරිදි ආදායම් රැස් කිරීමට නොහැකි වූ බැවින් එම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව. | මහජනතාවට පොදු පහසුකම් සැලසීම ඉටු කරදිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උප පත්‍රිකා පොත් නිකුත් කිරීම, ආපසු භාර ගැනීම සහ මුදල් භාර ගැනීම ආදි කටයුතු වල අධීක්ෂණ තත්ත්වයේ පවතින දුර්වලතාවයන් හේතුවෙන් උප පත්‍රිකා පොත් 03 කින් සභාවට ලැබිය යුතු රු.29,175 ක් අහිමි වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි දුර්වලතා ඇති නොවීමට කටයුතු කරන බව. | පාඩු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන යටිතල පහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් ආසියානු සංවර්ධන ආධාර යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මහල් දෙකකින් සමන්විත ප්‍රාදේශීය සභා බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී සියයට 9 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු.8,834,609 ක ණය ලබාගෙන තිබුණි. ණය ලබාදීමට අදාළ කොන්දේසි අනුව ණය ආපසු ගෙවීමට වර්ෂ 12 ක කාලයක් ලබාදී තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වනවිට මුළු ණය මුදලේ ශේෂය රු.11,320,648 ක් විය. ඒ අනුව ණය වාරික හා පොලිය අදාළ කාලය තුළ ගෙවා අවසන් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාළ ණය වාරික ගෙවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් සභාවට නොලැබෙන අතර ඉදිරියේදී ආදායම් වර්ධනය කොට අදාළ වාරික ගෙවීමට කටයුතු කරන බව. | ණය වාරික හා පොලිය නියමිත පරිදි ගෙවිය යුතුය. |